(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 88.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2016 අගෝස්තු මස 09 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

385/'15

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයට අයත් කාර්මික නිලධාරින්ට ව්‍යාපෘති ඇස්තමේන්තු අනුමත කිරීමේ උපරිම සීමාව රුපියල් ලක්ෂ දහයක් වන බවත්;

(ii) රුපියල් ලක්ෂ 10ට වඩා වැඩි ඇස්තමේන්තු අනුමත කිරීම ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ, විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් සිදු කළ යුතු බවත්;

(iii) තාක්‍ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරින් ප්‍රමාණවත් සංඛ්‍යාවක් රාජ්‍ය සේවයේ නොමැති බවත්;

(iv) එහෙයින් ව්‍යාපෘති ඇස්තමේන්තු අනුමත කිරීමේදී ප්‍රමාදයන් සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) දකුණු පළාතේ දැනට සේවයේ යෙදී සිටින,

(i) කාර්මික නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) තාක්‍ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කාර්මික නිලධාරින්ට ව්‍යාපෘති අනුමත කිරීමට හැකි සීමාව ඉහළ දැමීමට කටයුතු කරන්නේද;

(ii) තාක්‍ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරින් අලුතින් බඳවා ගැනීමට කටයුතු කරන්නේද;

(iii) ව්‍යාපෘති අනුමතවීම ප්‍රමාදවීම වැළැක්වීමට ගන්නා වෙනත් ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

488/'16

2.

ගරු කනක හේරත් මහතා,— කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ දිවයිනෙන් වාර්තා වූ ළමා අපචාර සිද්ධි සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිද්ධීන්වලට සම්බන්ධ සැකකරුවන් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා වැරදිකරුවන්ට නීත්‍යානුකූලව දඬුවම් කර තිබේද;

(iii) පරීක්ෂණ පවත්වා නීත්‍යානුකූලව කටයුතු කිරීමට නොහැකි වූ සිද්ධීන් ඉතිරිව තිබේද;

(iv) එසේ නම්, එම පරීක්ෂණ කඩිනම් කිරීමට යම් ක්‍රියාමාර්ගයක් ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

599/'16

3\.

ගරු ලකී ජයවර්ධන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාවෙන්, පළාත් සභා හා මධ්‍යම රජය යටතේ ක්‍රියාත්මක පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ (i) හි පාසල් අතරින් ස්ථිර පත්වීමක් නොමැතිව වැඩ බලන හා තාවකාලික පදනම මත සේවය කරන විදුහල්පතිවරුන් සිටින පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ස්ථිර පත්වීම් නොලැබූ විදුහල්පතිවරුන් සිටින එම පාසල්වල පරිපාලනය නිසි ලෙස සිදු නොවන බව පිළිගන්නේද;

(iii) ස්ථිර විදුහල්පතිවරුන් නොමැති පාසල්වලට ස්ථිර විදුහල්පතිවරු පත්කිරීමට කඩිනම් පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

609/'16

4\.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012, 2013, 2014 වර්ෂවලදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් බස් රථ අමතර කොටස් මිලදී ගැනීමේදී අනුගමනය කළ ක්‍රමවේදය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එය, ඊට පෙර පැවති ක්‍රමවේදයට වඩා වෙනස් වන්නේ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත වර්ෂවලදී ශ්‍රී ලංගමයට අමතර කොටස්,

(i) සැපයීම සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ සමාගම් හා ඔවුන්ගේ ලිපිනයන්;

(ii) සැපයූ සමාගම හා එහි ලිපිනය;

(iii) සැපයූ දිනයන් හා ඒවායේ වටිනාකම්;

(iv) ආනයනය වෙනුවෙන් රජයට ගෙවන ලද බදු මුදල්;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ගෙන්වන ලද අමතර කොටස්වල මිල, ප්‍රමිතිය සහ අවශ්‍යතාවය සම්බන්ධයෙන් ශ්‍රී ලංගමය සෑහීමට පත් වන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

625/'16

5\.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අඹතලේ ජල පවිත්‍රාගාරය සතු විදුලිජනක යන්ත්‍රයේ ධාරිතාව කවරේද;

(ii) අඹතලේ ජල පවිත්‍රාගාරයෙහි දෛනික ජල විදුලි පරිභෝජනය ඒකක කොපමණද;

(iii) දීර්ඝ කාලයක් සඳහා විදුලිය විසන්ධි කර ඇති අවස්ථාවක අඛණ්ඩ පානීය ජල සැපයුමක් පවත්වා ගැනීම සඳහා මෙම විදුලිජනක යන්ත්‍රය ප්‍රමාණවත්ද;

(iv) එසේ නම්, 2016 මාර්තු 13 වැනි ඉරිදා දින මුළු දිවයිනටම විදුලිය නොමැති වූ විට අඹතලේ ජල පිරිපහදුවේ කටයුතු සිදු කිරීමට නොහැකි වූයේ මන්ද;

(v) එම විදුලි ජනක යන්ත්‍රය ප්‍රමාණවත් නොවේ නම්, මේ පිළිබඳව අඹතලේ ජල පවිත්‍රාගාරයේ ප්‍රධානියා අදාළ බලධාරින්ට දැනුම් දුන්නේද;

(vi) දැනුම් දී තිබුනේ නම්, ඒ සඳහා ගත් පියවර කුමක්ද;

(vii) එසේ දැනුම් දී තිබුනේ නම්, බලධාරින් විසින් එම දැනුම් දීම පැහැර හැරීම පිළිබඳව ඔබතුමා ගන්නා පියවර කුමක්ද;

(viii) එසේ නොවේ නම්, දැනුම් නොදීම සම්බන්ධව වගකිව යුත්තන්ට එරෙහිව ගන්නා පියවර කුමක්ද;

(ix) අනාගතයේ ජනතාවට අත්‍යවශ්‍ය පානීය ජලය අඛණ්ඩව ලබාදීමට කටයුතු කරන්නේද;

(x) එසේ ලබාදීමට කටයුතු කරන්නේ නම්, ඒ පිළිබඳව විස්තර කළ හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

636/'16

6\.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2003 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවකයින් 18 දෙනෙක් තමන්ගේ මානව හිමිකම් කඩවී ඇති බවට මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවත්;

(ii) 2007 වර්ෂයේදී එම සේවකයින්ගේ මානව හිමිකම් කඩවී ඇති බවට එවකට පැවති ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය වෙත දන්වා ඇති බවත්;

(iii) ඒ අනුව, 2014 වර්ෂයේදී එවකට ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතා විසින් මානව හිමිකම් කොමිසමේ තීරණය ක්‍රියාත්මක කරන මෙන් සියලු ලේකම්වරුන් වෙත දන්වා යවා තිබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක 17/2005 දරන චක්‍රලේඛය ජනමාධ්‍ය අමාත්‍යාංශය පිළිගන්නේද;

(ii) එසේ නම්, ඉහත අ (i) හි සඳහන් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවකයින් 18 දෙනා සඳහා එම චක්‍රලේඛය අනුව හිමිකම් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

640/’16

7\.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට මත්පැන් බලපත්‍ර ලබාදීම ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) එවකට ශ්‍රී ලංකාණ්ඩුවේ ප්‍රධානියා කවුරුන්ද;

(iii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට මත්පැන් බලපත්‍ර අවසන් වරට ලබා දුන් වර්ෂය කවරේද;

(iv) එවකට ශ්‍රී ලංකාණ්ඩුවේ ප්‍රධානියා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අවසන් වරට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට මත්පැන් බලපත්‍ර ලබා දුන් අවස්ථාවේදී බලපත්‍ර ලබා නොගත් මන්ත්‍රීවරයන් කවුරුන්ද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

645/’16

8\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අංක 1904 හා 2015.02.27 දිනැති ගැසට් පත්‍රය මඟින් අයදුම්පත් කැඳවා, විභාග දෙපාර්තමේන්තුව මඟින් 2015.06.26 දින පවත්වන ලද “ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ, 2 වැනි පංතියේ, II ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2015” සඳහා අයදුම් කළ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අනුව රුපියල් 500/- බැගින් විභාග ගාස්තු ලෙස එකතු වූ මුළු මුදල කොපමණද;

(iii) විභාගයට හා සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට අනුව පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ සංඛ්‍යාව කොපමණද;

(iv) සුදුසුකම් ලැබූවන්ගේ නාම ලේඛනය හා ලකුණු අනුපිළිවෙළ සභාගත කරන්නේද;

(v) සුදුසුකම් සපුරන ලද පිරිස මේ දක්වා බඳවා නොගැනීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

657/’16

9\.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අංක 1951/13 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ 24 වැනි වගන්තිය ක්‍රියාත්මක කිරීමේදී ක්වාසි විනිසුරුවරු විසින් ජුම්ආ පල්ලිවලට අයත් භාරකරුවන්ගේ දායකත්වය සහ ඔවුන්ගේ සහාය ලබාගැනීමේ අවශ්‍යතාවය පැන නඟින බව දන්නේද;

(ii) රාජකාරිමය අවශ්‍යතා සඳහා ක්වාසි විනිසුරුවන් විසින් දිවයිනේ ජුම්ආ පල්ලිවල භාරකරුවන්ට යොමු කරන නිවේදන, එම පල්ලිවලට අයත් දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කිරීමේ අවශ්‍යතාවය සහ සම්ප්‍රදායානුකූලව පවතින එම වගකීම් දැනුවත් කරමින් අවශ්‍ය උපදෙස් නිකුත් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

663/'16

10.

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌන සුදුසුකම් සහිත පුද්ගලයන් ලෙස සැලකෙන තැපැල් ස්ථානාධිපතිවරු සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට විශ්‍රාම වැටුපක් හිමි වන්නේද;

(iii) එසේ නොවේ නම්, ඔවුන් තැපැල් සේවයට සිදු කළ දීර්ඝකාලීන සේවය සලකා කිසියම් සහනදායී දීමනාවක් හෝ ලබා දීමට හැකියාවක් තිබේද;

(iv) එසේ නොමැති නම්, ඔවුන්ගේ අභිවෘද්ධිය උදෙසා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

667/'16

11.

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය මඟින් ප්‍රකාශ කර ඇති පරිදි අග්‍රාමාත්‍යවරයාගේ චීන සංචාරයේ දී එකඟ වූ බවට සඳහන් කරන මත්තල ගුවන් තොටුපළ ආශ්‍රිත විශේෂ චීන කර්මාන්ත කලාපය පිළිබඳව චීන රජය සමඟ එළැඹී ඇති ගිවිසුමක් හෝ එකඟතා ලියවිල්ලක් තිබේද;

(ii) එසේ නම්, එම ලියවිල්ල සභාගත කරන්නේද;

(iii) එම විශේෂ චීන කර්මාන්ත කලාපය පිහිටුවීමේ මූලික කොන්දේසි හා කළමනාකරණය සිදු වන ආකාරය පැහැදිලි කරන්නේද;

(iv) එම කර්මාන්ත කලාපය සඳහා හඳුනාගෙන ඇති භූමියේ සිතියමක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

386/'15

12.

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා යුධ හමුදාවේ සේවය කරන මේජර්වරයෙකු වන ජේ. ආර්. එස්. රූපසිංහ මහතාට එරෙහිව මේ වනවිට යම් පරීක්ෂණයක් ක්‍රියාත්මක වෙමින් පවතීද;

(ii) එසේ නම්, එයට හේතුව කවරේද;

(iii) මෙම පරීක්‍ෂණය මෙහෙයවන නිලධාරින්ගේ නම් හා තනතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේජර් ජේ. ආර්. එස්. රූපසිංහ මහතාට සාධාරණයක් කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

600/'16

13\.

ගරු ලකී ජයවර්ධන මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දඹදිව වන්දනා චාරිකා සංවිධානය කරන ආයතන විශාල ප්‍රමාණයක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බවත්;

(ii) එකී සමහර ආයතන මඟින් විදෙස් ගතවන වන්දනාකරුවන්ගේ සුරක්ෂිතභාවය පිළිබඳව නිසි ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකරන බවත්;

(iii) එම නිසා බැතිමතුන් මහත් අසීරුතාවයට පත්වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) දඹදිව පූජා භූමි වන්දනා කිරීම සඳහා වසරකට සහභාගී වන වන්දනාකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) විදෙස් ගතවන ශ්‍රී ලාංකික වන්දනාකරුවන්ගේ සුරක්ෂිතභාවය සහතික කිරීම සඳහා වන්දනා චාරිකා සංවිධානය කරන ආයතන නියාමනය කිරීමට විධිමත් ක්‍රමවේදයක් සකසන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

611/'16

14\.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වසරේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට අපනයනය කළ කරුංකා ප්‍රමාණය;

(ii) ඒවායේ වටිනාකම;

(iii) අපනයනකරුවන් හා ඔවුන්ගේ ලිපිනයන්;

(iv) එක් එක් අපනයනකරු අපනයනය කළ ප්‍රමාණය හා වටිනාකම;

(v) එක් එක් අපනයනකරු රජයට ගෙවූ බදු මුදල;

වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 වසරේ සිට මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවට ආනයනය කළ කරුංකා ප්‍රමාණය;

(ii) ඒවායේ වටිනාකම;

(iii) ආනයනකරුවන් හා ඔවුන්ගේ ලිපිනයන්;

(iv) එක් එක් ආනයනකරුවන් ආනයනය කළ ප්‍රමාණය හා වටිනාකම;

(v) ආනයනය කළ රට;

(vi) එක් එක් ආනයනකරු රජයට ගෙවූ බදු මුදල;

වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2010 වසරේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ කරුංකා නිෂ්පාදනය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) නීතිවිරෝධී ලෙස කරුංකා ප්‍රති අපනයන ක්‍රියාවලියක් ශ්‍රී ලංකාව හරහා සිදුවන බවත්, එමඟින් දේශීය කරුංකා නිෂ්පාදකයන් සහ අපනයනකරුවන් දුෂ්කරතාවයට පත්ව ඇති බවත් පිළිගන්නේද;

(iii) මෙම නීතිවිරෝධී ප්‍රති අපනයනය වැළැක්වීමට රජය ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

627/'16

15.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂය තුළ නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයේ බිඳ වැටීම් සිදු වූ අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(ii) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ආරම්භයේ සිට මේ දක්වා සිදු වූ බිඳ වැටීම් සංඛ්‍යාව කොපමණද;

(iii) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය රටේ සමස්ත විදුලි අවශ්‍යතාවයෙන් කොපමණ ප්‍රතිශතයක් ලබා දෙන්නේද; එම ඒකක සංඛ්‍යාව කොපමණද;

(iv) තාප විදුලි බලාගාරයක් මත රටේ ජාතික විදුලි නිෂ්පාදනයට යැපීමට සිදුවීම අවදානම් සහගත කටයුත්තක් නොවේද;

(v) නොඑසේ නම්, එය පැහැදිලි කරන්නේද;

(vi) එම අවදානමෙන් මිදීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන (සංශෝධන),— 2015 අංක 16 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

2.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— නීති කොමිෂන් සභා (සංශෝධන),— 1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

3.

ගරු කේ. කේ. පියදාස මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

4.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"රාජිත සේනාරත්න පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

5.

ගරු තේනුක විදානගමගේ මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 3),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ලක් ජනසෙත පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

සත්ව ආහාර (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනත යටතේ නියෝග,— 1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනතේ 60 වැනි වගන්තිය යටතේ ආහාර සුරක්ෂිතතාව අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජූලි 2 දිනැති අංක 1921/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.04.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— 2016 ජුනි 22 දිනැති අංක 1972/33 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින්, සිංහල හා දෙමළ භාෂා පිටපත්වල මුද්‍රණ දෝෂ නිවැරදි කරනු ලැබූ, මෝටර් වාහන පනතේ (203 වැනි අධිකාරය වූ) 122 වගන්තිය සහ VII අ කොටස සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 නොවැම්බර් 02 දිනැති අංක 1939/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.07.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරියගේ වැටුප හා දීමනා ප්‍රතිශෝධනය කිරීම,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (1) වගන්තිය අනුව කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයන් ඉටුකරලීම පිණිස එම කොමිෂන් සභාවට සහාය වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත්කිරීමට සහ එම තනතුර දරන තැනැත්තාට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන වැටුපක් ගෙවීමට විධිවිධාන සලස්වා දී ඇති හෙයින්ද;

අවදානමක් දැරිය යුතු තනතුරක් වන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට 2015.02.12 දින රජයේ අවශ්‍යතාවය මත නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් ධූරයේ රාජකාරි කළ ජනාධිපති නීතිඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය පත්කිරීම මත, ඇයට පෞද්ගලික වන සේ පහත සඳහන් වැටුප් හා දීමනා 2015.02.12 දින සිට ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) අතිරේක සොලිසිටර් ජනරාල් තනතුරට හිමි මාසික වැටුප සහ සියලු දීමනා (දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව සහ නිවාස කුලී දීමනාව හැර);

සහ

(ආ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධූරයට හිමි අමාත්‍යාංශ ලේකම් දීමනාව, දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව හා රජයේ නිල නිවාසයක් ලබාදී නොමැති නම් නිවාස කුලී දීමනාව.

ඊට අනුකූලව, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, ජනාධිපති නීතිඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයන් හා සාමාජිකයින් වෙත ගෙවනු ලබන පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා,— දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන් හා සාමාජිකයින් වෙත පහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා, අදාළ කොමිෂන් සභා සත්‍ය වශයෙන්ම රාජකාරි ආරම්භ කරන ලද දිනය, අදාළ ගෙවීම් බලාත්මක වන දිනය ලෙස සලකමින් ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) නිල බලයෙන් පත්වන සභාපතිවරයන් හැර අනෙකුත් සභාපතිවරයන් සඳහා රු. 100,000/-ක මාසික දීමනාවක් ද, රු. 10,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් සහ එකී වාහනය සඳහා ඉන්ධන ලීටර් 225ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්ද;

(ආ) නිල බලයෙන් පත්වන ස්වාධීන කොමිෂන් සභා සභාපතිවරයන් සඳහා තම නිත්‍ය තනතුරේ වැටුප් හා දීමනාවලට අතිරේකව, ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයෙකුගේ මාසික දීමනාවෙන් 50%ක මාසික දීමනාවක්ද;

(ඇ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ හැර අනෙකුත් ස්වාධීන කොමිෂන් සභාවල නිල බලයෙන් පත් නොවන සාමාජිකයින් සඳහා රු. 75,000/-ක මාසික දීමනාවක්ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, තම පදිංචි ස්ථානයේ සිට කොමිෂන් සභා කාර්යාලයට යාමට ඇති දුර ප්‍රමාණය අනුව කිලෝ මීටර් 350 දක්වා රු. 25,000/-ක ප්‍රවාහන දීමනාවක් හෝ කිලෝ මීටර් 350ට වැඩි දුර ප්‍රමාණයක් වෙනුවෙන් රු. 50,000/-ක ප්‍රවාහන දීමනාවක්ද;

(ඈ) 2015.06.17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 3/2015 විධිවිධාන පරිදි නිල බලයෙන් පත්වන සාමාජිකයින් සඳහා එක් රැස්වීම් වාරයකට සහභාගි වීම වෙනුවෙන් රු. 10,000/-ක දීමනාවක්ද;

(ඉ) 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ (8) වැනි වගන්තියට අනුව එම කොමිෂන් සභාවේ සභාපතිට හා සමානව සාමාජිකයින්ට ද බලතල පැවරී ඇති බැවින්, එම කොමිෂන් සභාවේ සාමාජිකයින්ට රු. 95,000/-ක මාසික දීමනාවක් ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් හා එම වාහනය සඳහා ඉන්ධන ලීටර් 170ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්;

සහ

(ඊ) මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා හා සාමාජිකයින් වෙත, මැතිවරණයක් ප්‍රකාශයට පත් කළ දින සිට ප්‍රතිඵල නිකුත් කරන දින දක්වා වූ කාලසීමාව සඳහා ඔවුන්ගේ මාසික දීමනාවෙන් ¾ක විශේෂ දීමනාවක් ද.

ඊට අනුකූලව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන්ට හා සාමාජිකයින්ට ඉහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා,— කාර්මික ආරවුල් පනත යටතේ නියෝග,— කලින් කලට සංශෝධනය කරන ලද, 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ (131 වැනි අධිකාරය වූ) 39 වැනි වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016.07.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— “ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*14.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 213ඇ වගන්තිය සමඟ කියවියයුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 දෙසැම්බර් 22 දිනැති අංක 1946/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*15.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*16.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*17.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**